කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 - 2023

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 02 හි II වගන්තියේ ආ.03 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

මූල්‍ය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයෝජන සැළසුම් සකස් කිරීම සඳහා සහාය වීම, නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැළපුම් දීමනාව ප්‍රදානය, කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යනාදී සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 20,051 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 105.15 ක් වන අතර ඉන් රු.මිලියන 11,700.61 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 61.05 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 8,451 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 44.10 ක් ප්‍රතිලාභීන් විසින් සැපයීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු පසු මූල්‍යනය යටතේ 2016 ඔක්තෝම්බර් 15 දින ආරම්භ කරන ලද අතර, 2021 ඔක්තෝම්බර් 31 වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීතිරීති හා රෙගුලාසි වලට යොමුව		විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි				
(i)	මු.රෙ. 396	ව්‍යාපෘතිය මගින් නිකුත් කරන ලද රු.මිලියන 2.3ක වටිනාකමින් යුත් චෙක්පත් තුනක් 2023 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ දින සිට මාස 6ක් ගතවී තිබුණ ද, බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණු	2024 ජුනි මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව, මාස හයකට වැඩි චෙක්පත් දෙකක් පමණක් තිබුණු අතර මු.රෙ. 396 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගනු ලැබේ.	මුදල් රෙගුලාසිවලට අනුව පියවර ගත යුතුය.

		අතර, එම චෙක්පත් සම්බන්ධයෙන් ව්‍යාපෘතිය මගින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.		
	(ii) මූ.රෙ. 756	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටු පත් කිරීම සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනකදී සිදු කළ යුතුය. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටු පත් කර නොතිබුණි.	වාර්තාව සමඟ ව්‍යාපෘතිය එකඟ වේ. එසේ වුවද, 2024 ජනවාරි මාසයේදී භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අප කමිටුවක් පත් කර ඇත.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටු පත් කිරීම මුදල් රෙගුලාසිවලට අනුව සිදු කළ යුතුය.
	(iii) මූ.රෙ. 757 - 1(ආ) සහ 2(ආ)	භාණ්ඩ සමීක්ෂණ කමිටුව සත්‍යාපනය කළ දිනට බඩු ලේඛන පොතෙහි දැක්වෙන ශේෂය සමඟ සසදා සෑම භාණ්ඩයක්ම නිවැරදිදැයි බලා යම් වෙනසක් දක්නට ලැබුනොත් එය ටී සහ ඒ 66 ආකෘතියෙහි සටහන් කර පිටපත් හතරකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ඉන්පසුව දෝෂ ගැලපුම් කිරීමට තහවුරුව සඳහා බඩු ලේඛන වවුචරයක් ලෙස ගොනු කිරීම සඳහා ආකෘතියේ පිටපතක් සම්බන්ධ ආයතනයට ඉදිරිපත් කළ යුතුය. සමීක්ෂණය අතරතුර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් මූ.රෙ. 757 -1(ආ) සහ 2(ආ) අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය.	2023 භාණ්ඩ සමීක්ෂණයෙහි යම් දෝෂයක් ඇති බවට එකඟ වේ. ඊළඟ වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය නියම කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කිරීමට ව්‍යාපෘතිය අපේක්ෂා කෙරේ.	භාණ්ඩ සමීක්ෂණ කමිටුව සෑම භාණ්ඩයක්ම බඩු ලේඛන පොතෙහි දක්වා ඇති ශේෂය සමඟ පරීක්ෂා කර ක්‍රියාමාර්ග ගත යුතුය.
	(iv) මූ.රෙ. 760	අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙල 102 වැනි හා ඊට පසු මුදල් රෙගුලාසිවල නියම කර ඇත. විධි වූ පරිදි අධිකාරි බලය පිට, බඩු ලේඛන පොත්,තොග පොත් ආදියෙන් භාණ්ඩ අස්කළ යුතු වුවද ඉහත ක්‍රියා පටිපාටිය නිසියාකාරව අනුගමනය කර නොතිබුණි.	2023 භාණ්ඩ සමීක්ෂණයෙහි යම් දෝෂයක් ඇති බවට එකඟ වේ. ඊළඟ වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය නියම කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කිරීමට ව්‍යාපෘතිය අපේක්ෂා කෙරේ.	මුදල් රෙගුලාසිවලට අනුව යාවත්කාලීන බඩු තොග පොත් තැබීමට කටයුතු කළ යුතුය.
(ආ)	අංක 01/2019 හා 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය	ජාතික මෙහෙයුම් කමිටුව (එන්එස්සී) රැස්වීම මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.	ජාතික මෙහෙයුම් කමිටුව නොව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ලෙස වෙනස් විය යුතුය. ව්‍යාපෘති මෙහෙයුම් කමිටු මීට පෙර පිහිටුවා නොතිබුණු අතර, ගැටලු සාකච්ඡා කිරීමේ ප්‍රධාන සංසදය වූයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ය.	කමිටු (එන්එස්සී) රැස්වීම චක්‍රලේඛයට අනුව පැවැත්විය යුතුය.

(ඇ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක එස්ඊසී/2022/ඊ/03 හා 2022 දෙසැම්බර් 23 දිනැති චක්‍රලේඛය	කොන්ත්‍රාත් පදනම මත මාසිකව රු. 100,000ට වඩා වැඩි ගෙවීම් මත රඳවා ගැනීමේ බදු සියයට 5ක් අඩු කර තිබිය යුතුය. ජීඅයිඑස් උපදේශක සඳහා මාසිකව රු. 150,000ක ගෙවීමට ව්‍යාපෘතිය ගිවිසුම් ගතව තිබුණි. 2023 වර්ෂය සඳහා ජීඅයිඑස් උපදේශක සඳහා ව්‍යාපෘතිය මගින් ගෙවන ලද රු. මිලියන 1.62 ක මුදලට අදාළව දළ වශයෙන් රු. 81,000 ක රඳවා ගැනීමේ බදු මුදල අඩු කර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා නොමැති බව නිරීක්ෂණය විය.	එස්ඊසී/2022/ඊ/03 චක්‍රලේඛය අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත උපදෙස් දෙන ලදී.	රඳවා ගැනීමේ බදු අඩු කිරීම සහ ගෙවීම චක්‍රලේඛයට අනුව සිදු කළ යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට ඉලක්කගත ප්‍රගතිය සියයට 86ක් සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 69ක් පමණක් වාර්තා වී තිබුණි.	කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - සංරචක 1 යටතේ, 2023.03.31 වන විට අනුමත උප ව්‍යාපෘති සංඛ්‍යාව 1,424 කි. කෙසේ වෙතත්, සලකා බලන දිනය වන විට, ව්‍යාපෘති 672 ක් පමණක් සිය කටයුතු අවසන් කර මූල්‍ය ප්‍රදානයන් ලබාගෙන ඇත. මීට අමතරව, උප ව්‍යාපෘති 666 ක් අදියර වශයෙන් සියයට 50 ක භෞතික ප්‍රගතියක් ලබා ගෙන ඇත. එබැවින් 2023.12.31 වන විට ලබාගෙන ඇත්තේ සියයට 69ක පමණ ප්‍රගතියක් පමණක් බව පිළිගනිමි.	නියමිත කාල රාමුව තුළ කාර්යයන් සම්පූර්ණ කළ යුතුය.
(ආ)	පාරම්පරික වී වගා කිරීමේ ව්‍යාපෘතිය සහ සෞඛ්‍ය සම්පන්න සහ උසස් තත්ත්වයේ සහල් නූඩ්ල්ස් නිෂ්පාදන ව්‍යාපෘතියේ අකාර්යක්ෂමතාව හේතුවෙන් රජය විසින් දරන ලද රු. මිලියන 12 ක ප්‍රතිලාභය රජයට අහිමි වී තිබුණි.	කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ ගැලපුම් ප්‍රදානයේ අනුමැතියට පෙර, කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 විසින් මෙම සමාගමට කිසිදු රජයේ ප්‍රදානයක් ලැබී නොමැති බව තහවුරු කරගෙන ඇති අතර කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ ප්‍රදානයෙන් මාස 8 කට පසු කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන විසින් ලබා දෙන ප්‍රදානය සඳහා කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 ට වගකිව නොහැක .	ග්‍රාමසේවා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් වැනි ප්‍රාදේශී රජයේ නිලධාරීන් හරහා කරුණු අනාවරණය කළ යුතුයි.

(ඇ)	කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය- අදියර 01 විසින් 2019 පෙබරවාරි 19 දින පැරබෝව්වා එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම සමඟ රු. මිලියන 10 ක වියදමින් සම්පූර්ණ ස්වයංක්‍රීය සහල් නූඩ්ල්ස් සාදන යන්ත්‍රයක් පිහිටුවීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 90ක් ගෙවා තිබුණි.කෙසේ වෙතත් සහල් වලින් නූඩ්ල්ස් නිෂ්පාදනය ආරම්භ කර නොතිබුණි.	ගැලපීමේ ප්‍රදාන ගිවිසුමට අනුව, කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය- අදියර 01 පැරබෝව්වා එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම සමඟ අත්සන් කර ඇති අතර, එකඟ වූ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය මත පදනම්ව අනුමත ප්‍රදානයේ 1 වන සහ 2 වන වාරිකය ලබා දීමට සිදු විය. එබැවින් 1 වන සහ 2 වන වාරික ක්‍රියාකාරකම්වල සාක්ෂාත් කර ගත් භෞතික ප්‍රගතිය සත්‍යාපනය කිරීමෙන් පසු රු. මිලියන 9ක් ලබා දී ඇත.	අපේක්ෂිත කාර්යයන් ඉලක්කගත කාලය තුළ අවසන් කර ඇති බව තහවුරු කිරීම් ලබා ගෙන ප්‍රතිලාභීන් වෙත ගෙවීම් නිදහස් කළ යුතුය.
(ඈ)	පැරාබෝව්වා එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම විසින් නූඩ්ල්ස් නිෂ්පාදන යන්ත්‍රය ස්ථාපිත කරන ලද ගොඩනැඟිල්ලෙහි විදුලි රැහැන් ඇදීම සහ විදුලි ආලෝක කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නූඩ්ල්ස් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන කෘෂිකර්ම නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපලට යොමු කිරිම ඉටු කර නොතිබුණු අතර අපේක්ෂිත අපනයන ආදායමද ලබා ගැනීමට නොහැකි වී නොතිබුණි.	සති කිහිපයකට පෙර, සමාගම සහල් නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීමේ වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇති අතර කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂණ වාර්තා ලබා ගැනීමෙන් පසු, 200g ක ස්පැගටි (රතු සහ සුදු) සහ වැමිසේල්ලි වර්ගයේ නුල්ඩ්ස් (රතු සහ සුදු) නිෂ්පාදන මුද්‍රිත ඇසුරුම් ද්‍රව්‍ය සමාගමට ලැබීමෙන් පසු ලබන මාසය වන විට වෙළඳපොළට නිකුත් කෙරේ.	කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.
(ඉ)	දේශීය හා ජාත්‍යන්තර ආහාර, රූපලාවන්‍ය ද්‍රව්‍ය, ආගන්තුක සත්කාර සහ ඖෂධ වෙළඳපොල සඳහා ස්වභාවික අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරිම , වසරකට ඇමරිකානු ඩොලර් 600,000 ක විදේශ විනිමය ඉපැයිම, ජීඑම්පී,අයිඑස්ඕ,එච්ඒසීසීපී,බීආර්සී කාබනික සහ සාධාරණ වෙළඳ සහතික ලබාගැනීම, ප්‍රදේශයේ සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය කිරිම අරමුණින් නියුට්‍රි ක්‍රොප් (පුද්ගලික) සමාගම 2019 අප්‍රේල් 17 දින ස්ථාපිත කර තිබුණි. සමාගම කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය සමඟ 2021 ජූලි 20 දින රු. මිලියන 15 ක ගැලපුම් ප්‍රදානයක් ලබාගැනීමට ගිවිසුම් ගත වී තිබුණි.2023 දෙසැම්බර් 31 වන විට	කර්මාන්තශාලා ක්‍රියාකාරිත්වය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2023 දෙසැම්බර් වන විට වාණිජ නිෂ්පාදනය ආරම්භ නොකළද, ප්‍රාදේශීය ගැලපුම් ප්‍රදාන කළමනාකරු 2024 මාර්තු මාසයේදී ව්‍යාපෘතියට නිරීක්ෂණය කරන විට, කර්මාන්තශාලා මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි .	අපේක්ෂිත කාර්යයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය.

ඉන් රු. මිලියන 13.5 ලබා දී තිබුණි. නමුත් නියුට්‍රි ක්‍රොප් (පුද්ගලික) සමාගම 2023 දෙසැම්බර් 31 වන තෙක් නිෂ්පාදනය ආරම්භ කර නොතිබුණි.		
(ඊ) ස්වේ නැචුරල්ස් (පුද්ගලික) සමාගම සම්බන්ධ නිරීක්ෂණ		
2020 දෙසැම්බර් 31 දින ස්වේ නැචුරල්ස් (පුද්ගලික) සමාගම සමඟ ශ්‍රී ලංකාවේ කුළු බඩු යොදා ගනිමින් අගය එකතු කල සුගන්ධ තෙල් නිෂ්පාදනය කිරිම හා අනාගත සැපයුම් අනුව කළමනාකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරිම සඳහා රු. මිලියන 77.93 ක ගැලපුම් ප්‍රදානයක් ලබා දීමට කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ගිවිසුම්ගතව තිබුණි. ගිවිසුමට එළැඹීම දින තුනකට පෙර එනම් 2020 දෙසැම්බර් 28 දින රු.මිලියන 50 ක පළමු ගැලපුම් ප්‍රදානය ලබාදී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට දෙවන හා තෙවන ගැලපුම් ප්‍රදාන ලබාදී නොතිබුණි. මේ අනුව ගැලපුම් ප්‍රදාන ලබාදීමේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබුණු බව නිරීක්ෂණය විය.	ප්‍රතිලාභියා විසින් උපව්‍යාපෘතියට අදාළ අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි කළමනාකරුවන් දෙදෙනෙකු, නීති කළමනාකරු සහ මූල්‍ය කළමනාකරු නීතිමය නිෂ්කාශනය සහ මූල්‍ය නිෂ්කාශනය ලබා දීම සඳහා ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ ලේඛන අධ්‍යයනය කරයි.	ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු අතර ගිවිසුම අත්සන් කිරීමට පෙර චෙක්පත් නොලිය යුතුය. මහජන මුදල් විනිවිදභාවයෙන් පරිහරණය කළ යුතුය.
(උ) නෙවිල් ඉන්ඩස්ට්‍රිස් (පුද්ගලික) සමාගම සම්බන්ධ නිරීක්ෂණ		
කෘෂිකාර්මික කර්මාන්ත යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කරන සමාගමක් වන නෙවිල් ඉන්ඩස්ට්‍රිස් (පුද්ගලික) සමාගම , කෘෂි කාර්මික යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම, ඵලදායි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා කුඩා හා මහා පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම, දේශීය නිෂ්පාදනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට සහාය වීම, අඛණ්ඩ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලිය හරහා උසස් යන්ත්‍රෝපකරණ සංවර්ධනය කිරීම ඇතුලු අරමුණු 8 ක් ඉටුකර ගැනීම සඳහා කෘෂි අංශ නවිකරණ ව්‍යාපෘතිය සමඟ රු.	2023 දෙසැම්බර් 31 දින වන විට, 2023 ජුනි 6 වන දින පළමු ගැලපුම් ප්‍රදානය නිකුත් කර මාස 06ක් පමණ ගත වී ඇත. 01 වන ගැලපුම් ප්‍රදානයට අදාළ ක්‍රියාකාරකම් සඳහා පමණක් ආයෝජනය කිරීමේදී අරමුණු අටක් සාක්ෂාත් කරගත නොහැකි අතර මෙය සම්පූර්ණ ආයෝජනය සම්පූර්ණ කිරීමෙන් පසුව විය යුතුය. කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් මේ වන විට අවසන් කර ඇති අතර 01 වන ගැලපුම් ප්‍රදානයට අදාළ යන්ත්‍ර ද මිලදී ගෙන කර්මාන්ත ශාලාවේ සවි කර ඇත. 01 වන ගැලපුම් ප්‍රදානය පියවීමට අදාළ ලියකියවිලි සහ බිල්පත් ප්‍රදානය ලබන්නා විසින් ඉදිරිපත් කර ඇති අතර දෙවන ගැලපුම් ප්‍රදානය නිකුත් කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු සම්පාදනය කරමින් පවතී.	ඉලක්කගත කාල සීමාව තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කළ යුතුය.

	මිලියන 30ක ගැලපුම් ප්‍රදානයක් ලබාගැනීමට 2023 ජුනි 06 දින ගිවිසුමකට එළැඹ තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ඉහත දක්වන ලද අරමුණු ලගා කර ගැනිමට සමාගම අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.		
(ඌ)	ඉස්සන් වගාව සඳහා ආහාර නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරිම අරමුණු කරගත් ග්‍රීන් ඇක්වා ප්‍රඩක්ෂන් (පුද්ගලික) සමාගම දේශිය ඉස්සන් ගොවීන් සඳහා අඩු මිලට සහ වඩා උසස් තත්ත්වයේ ඉස්සන් සඳහා වන ආහාර සැපයිම, රටේ සමස්ත ඉස්සන් සඳහා වන ආහාර අවශ්‍යතාවයෙන් සියයට 25 ක් සම්පූර්ණ කිරීම, අමුද්‍රව්‍ය සඳහා තිරසර සැපයුම් දාමයක් නිර්මාණය කිරීම සහ ප්‍රදේශයේ සහ ගොවිබිම්වල නව රැකියා අවස්ථා ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සමඟ රු. මිලියන 93.8 ක් ගැලපුම් ප්‍රදානයක් ලබාගැනිමට 2022 පෙබරවාරි 07 දින ගිවිසුම්ගත වී තිබුණි. 2023 දෙසැම්බර් වන විට පළමු හා දෙවන ප්‍රදාන වාරික ලෙස රු. මිලියන 84.42 ක් ලබාගෙන තිබුණි. 2023 ඔක්තෝබර් 20 වන විට ඉස්සන් ආහාර කිලෝග්‍රෑම් 35,000 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර ඒ හේතුවෙන් සමාගමේ අරමුණු ඉටු කර ගැනීම දුර්වල තත්ත්වයක තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ලබා දුන් ප්‍රදානවලින් අපේක්ෂිත අරමුණු ලඟා කර නොගැනිම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අහිමි වි තිබුණි.	විදේශ විනිමය අර්බුදය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත. මෙම ඉදිකිරීම සංකීර්ණ වන අතර රු. මිලියන 80 කට වඩා වැඩි වටිනාකමක් ඇත. මෙය වඩාත් අභියෝගාත්මක වූ අතර බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ඉල්ලා සිටියේය. සැලසුම් කළ පරිදි දෙවන වාරික කටයුතු යටතේ ද ඉදිකිරීම් අඛණ්ඩව සිදු කර ඇති බව ද සඳහන් වේ. 2024 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය ගැලපුම් ප්‍රදාන කළමනාකරු විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කරන විට, ගොඩනැගිල්ල ඉදිකිරීම් අවසන් කර තිබු අතර ප්‍රදානය ලබන්නා වාර්තා කරනු ලැබුවේ නිෂ්පාදනය 2023 අගෝස්තු මාසයේදී ආරම්භ කර ඇති බවයි.	ඉලක්කගත කාල සීමාව තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කළ යුතුය.
(එ)	ඉකෝ එන්වී ලංකා (පුද්ගලික) සමාගම දේශිය අමුද්‍රව්‍ය සපයා ගනිමින් ජෛව හායනයට ලක්විය හැකි පොලිතින් හා ප්ලාස්ටික් සඳහා කාබනික ආදේශක නිෂ්පාදනය කිරිම සඳහා නිෂ්පාදන පහසුකම් ස්ථාපිත කිරිම සඳහා ආරම්භ කරන	මෙම ආයතනයේ ඉදිකිරීම් කටයුතු සහ යන්ත්‍ර සවි කිරීම සඳහා වසරකට වැඩි කාලයක් ගතවී ඇති අතර ආර්ථික අර්බුදය සහ ව්‍යාපෘතිය යටතේ වෙනත් සමාන උප ව්‍යාපෘති වල අත්දැකීම් සලකා බැලීමේදී මෙම තත්ත්වය සාමාන්‍ය තත්ත්වයකි. ප්‍රදානලාභියා දෙවන වාරික වියදම් පියවීම සඳහා අවශ්‍ය	අපේක්ෂිත කාලය තුළ හඳුනාගත් අරමුණු සාක්ෂාත් කර ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියා කළ යුතුය.

	ලදී. මෙම සමාගම 2021 නොවැම්බර් 25 දින කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සමඟ රු. මිලියන 24.89 ක ගැලපුම් ප්‍රදානයක් ලබාගැනීමට ගිවිසුමකට එළැඹ තිබුණි. 2022 මාර්තු 31 දින වන විට, පළමු හා දෙවන ගැලපුම් ප්‍රදාන ලෙස රු. මිලියන 22.40 ක් ලබාගෙන තිබුණි. තුන්වන ගැලපුම් ප්‍රදානය 2023 දෙසැම්බර් 31 දින වන විට ලබාගෙන නොතිබුණි. අපනයන වෙළඳපොළට ඇතුළුවීම, සම්ප්‍රදායික හස්ත කර්මාන්ත නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, ආනයනික ප්ලාස්ටික් අමුද්‍රව්‍ය වෙනුවට ආදේශක නිෂ්පාදනය කිරීම හා වෙළඳපොළට සාර්ථකව ප්‍රවේශ වීම යන සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගෙන නොතිබුණි.	ලියකියවිලි ඉදිරිපත් කර ඇති බැවින් තෙවන වාරිකය නිකුත් කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ඉතිරිව ඇති අතර ප්‍රදානලාභීයා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි කාර්ය මණ්ඩලයේ කාර්යයක් වේ.	
(ඒ)	වනාතවිල්ලුව කාබනික කජු සමාගම සම්බන්ධ නිරීක්ෂණ		
	වනාතවිල්ලුව කාබනික කජු සමාගම සඳහා 2020 මාර්තු 02 ඉදිරිපත් කරන ලද ගැලපුම් ප්‍රදාන අයදුම්පත්‍රය සඳහා ඊට මාස 21 කට පසු එනම් 2022 දෙසැම්බර් 01 දින ව්‍යාපෘතිය විසින් අනුමත කර තිබුණි. අනුමත රු. මිලියන 32.40 න්, 2023 අප්‍රේල් 28 වන දින පළමු ප්‍රදාන වාරිකය ලෙස රු මිලියන 9.72 ක් නිකුත් කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින දක්වා දෙවන සහ තෙවන ප්‍රදාන වාරික නිකුත් කර නොතිබුණි. ඒ අනුව, සමාගම 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි.	වනාතවිල්ලුව කාබනික කජු ලිමිටඩ් (සමාගම) හි සාමාජිකයින් 54 දෙනෙකු සඳහා ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022 දෙසැම්බර් 1 වන දින ලබා ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව, සාමාජිකයින් 9 දෙනෙකුට ස්වකීය මූල්‍ය දායකත්වය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම සාමාජිකයින් 9 දෙනාගේ සාමාජිකත්වය සමාගම විසින් අවලංගු කර ඇත. ඒ වෙනුවට තවත් සාමාජිකයින් 9 දෙනෙකු සමාගමට සම්බන්ධ වූ අතර එම නව සාමාජිකයින්ට අදාළ ලිපි ලේඛන ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කරන ලදී. දෙවන වාරිකය 2024.6.25 දින නිකුත් කරන ලදී.	ඉලක්කගත කාල සීමාව තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කළ යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ව්‍යාපෘතියේ ජීඅයිඑස් (භූගෝලීය තොරතුරු පද්ධතිය) උපදේශක 2023 දෙසැම්බර් මාසයේ සිට විගණන දිනය දක්වා කළමනාකාරිත්වයට තම කළ වැඩ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	ව්‍යාපෘතියේ ජීඅයිඑස් උපදේශකවරයාට ඔහු මේ වන තෙක් තම කළ වැඩ වාර්තා ඉදිරිපත් කර නොමැති අතර කළ වැඩ වාර්තා වහාම යැවීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. ජීඅයිඑස් උපදේශකවරයා වෙහෙස මහන්සි වී වැඩ කරන අතර අවශ්‍ය විට, සති	උපදේශකගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කළ

	එබැවින්, 2023 දෙසැම්බර් මස ජීඅයිඑස් උපදේශන ගාස්තුව රු. 150,000ක මුදල උපචිත කර නොතිබුණි. ඒ අනුව, ජීඅයිඑස් උපදේශකවරයාගේ රාජකාරිවලට අදාළව ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව පිළිබිඹු වී නොමැති අතර ව්‍යාපෘතිය ඔහුගේ කාර්යය නිසි ලෙස අධීක්ෂණය කර නොමැති බව නිරීක්ෂණය විය.	අන්තයේද ඔහුගේ කාර්යයන් ඉටු කරයි. ඔහු මෙම ව්‍යාපෘතිය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.	යුතුය.
(ආ)	ගැලපුම් ප්‍රදාන හතරක් සඳහා 2022 වර්ෂයේදී රු. මිලියන 20.84 ක් වටිනා චෙක්පත් ලියා ඇතත් එම චෙක්පත් නිකුත් කර නොතිබූ අතර 2023 වසර දක්වා අතැතිව තිබුණි. 2023 වර්ෂයේදී එම චෙක්පත් අවලංගු කර ඇති බවත් එම මුදල ප්‍රදාන ආපසු ගෙවීම් ලෙස 2023 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති බවත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.	චෙක්පත් ලියා ප්‍රතිලාභියාගේ ස්ථාවරත්වය නොමැතිකම හේතුවෙන් ප්‍රතිලාභියාට භාර නොදෙන ලදී. ගෙවන ලද මුදල් නැවත ලබාගැනීම දුෂ්කර නම් එම අවදානම වලක්වාගැනීම සඳහා එය සිදු කරන ලදී .එය 2022 මූල්‍ය ප්‍රකාශනයේ තත්ත්වය වැඩියෙන් දැක්වීමක් වන අතර කෙසේ වෙතත් 2023 මූල්‍ය ප්‍රකාශයේ අවසාන ප්‍රතිඵලය නිවැරදි ආකාරයෙන් පවතී.	සියලුම අවශ්‍යතා සපුරාලීමෙන් පසු අරමුදල් නිකුත් කළ යුතුය.

3.3 නිෂ්ක්‍රිය/ අක්‍රිය/ ඌන උපයෝජිත සම්පත්

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
අ)	ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට අරමුදල් භාවිතයේ ප්‍රගතිය සලකා බැලීමේදී, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය මුදලින් වෙන් කර ඇති ඩොලර් මිලියන 61.05 න් ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත්තේ ඩොලර් මිලියන 43.32 ක අරමුදල් පමණක් බව නිරීක්ෂණය විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 70ක් විය. එබැවින්, ඉතිරි වසරක කාලසීමාව ඉතිරි අරමුදල් සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය.	2023 ජූලි මාසයේදී ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර මුළු ව්‍යාපෘති වටිනාකම ඩොලර් මිලියන 48.620 දක්වා අඩු විය . නව ව්‍යාපෘති වටිනාකමට අනුව මූල්‍ය ප්‍රගතියෙන් සියයට 80ක් පමණ ළඟා කර ගෙන ඇත.	ව්‍යාපෘතියේ හඳුනාගත් කාර්යයන් නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කළ හැකි රු. මිලියන 4,000 ක විදේශ ණය සඳහා වෙන් කළ මුදලින් රු. මිලියන 1,275 ක් පමණක් ව්‍යාපෘතිය භාවිත කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින් මුළු ප්‍රතිපාදනවලින් සියයට 68 ක් නියෝජනය වන පරිදි රු. මිලියන 2,724 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	විදේශ ණය (12) යටතේ ශ්‍රී ලංකා රජයේ වෙන් කිරීම රු. මිලියන 4000 න් රු. මිලියන 1,275 ක් භාවිතා කර තිබුණි. ප්‍රතිපාදනවල ශේෂය රු. මිලියන 2,724 කි. කෙසේ වෙතත්, ඩොලර් මිලියන 48.620 ක ණය ප්‍රතිපාදන 2024/12/31 ව්‍යාපෘති කාල සීමාව තුළ භාවිතා කළ හැකිය.	ව්‍යාපෘතියේ කාර්යයන් සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති කාල රාමුව තුළ සම්පූර්ණ කළ යුතුය.

3.4 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	2023 මාර්තු, අප්‍රේල් සහ මැයි මාස සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු. 66,218 ක සේ.භා.අ. අධිභාරය ගෙවන ලදී. සේවක භාරකාර අරමුදල් මණ්ඩලය සමඟ සාර්ථක සාකච්ඡා කිරීමකින් තොරව ව්‍යාපෘතිය 2024 අප්‍රේල් 8 වන දින මෙම මුදල ගෙවා තිබුණි.	සේ.භා.අ.ගෙවීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා අපි දැනට සේ.භා.අ අන්තර්ජාලය හරහා ගෙවමින් ප්‍රමාදයකින් තොරව යාවත්කාලීන කරන්නෙමු.	අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කල යුතුය.
(ආ)	විගණන තොරතුරුවලට අනුව, 2023 දෙසැම්බර් 31 වන විට කුඩා පරිමාණ ව්‍යාපෘති 99 ක් සහ මහා පරිමාණ ව්‍යාපෘති 65 ක් අවසන් කර තිබුණි. විගණිත දිනය වන විට ව්‍යාපෘති ගිවිසුමට අනුව නිම කරන ලද ව්‍යාපෘති සඳහා කිසිදු සම්පූර්ණ කිරීමේ වාර්තාවක් කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය මගින් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.	සම්පූර්ණ කරන ලද වාර්තාවක් සහ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇත. එය ආර්එම්ජීඑම් පද්ධතිය සමඟ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් හුවමාරු කර ගත් අතර, ඒ සමඟ වැඩ අවසන් කළ ප්‍රතිලාභීන් වෙත උපදෙස් ද යවන ලදී. ප්‍රතිලාභීන් මේ වන විට පණිවිඩවලට ප්‍රතිචාර දක්වති.	ව්‍යාපෘතිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.

3.5 පද්ධතිය සහ පාලන

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	වාහන ධාවන සටහන් නිසි ලෙස පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද, 2023 වසරේ අවසන් මාස හය සඳහා වාහන පහක වාහන ධාවන සටහන් භාරදී නොතිබුණි. 2024 ජූලි 15 වන විට එම මාස හය සඳහා ව්‍යාපෘතිය මගින් ගෙවිය යුතු එම වාහන රියදුරන්ගේ අතිකාල (ඕටී) සහ ගමන් වියදම් දීමනාව (බටා) ගෙවා නොමැති බව නිරීක්ෂණය විය.	පිළිගනිමු. එම වාහන පහෙහි ධාවන සටහන් පිළිබඳ විමසීම් කරන ලද අතර ඉදිරිපත් කිරීමට හැකිය. ව්‍යාපෘතියේ රියදුරන්ගේ තහවුරු කිරීම්වලට අනුව, ඉහත සඳහන් කළ වාහන සඳහා පිළිවෙළින් සියලුම අතිකාල සහ ගමන් වියදම් දීමනා ගෙවීම් සඳහා ඔවුන් (2024 ජූලි 15 වැනි දිනට පෙර) හිමිකම් පා ඇත.	වාහන ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර සේවක දීමනා නිසි ලෙස සිදු කළ යුතුය.
(ආ)	කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයේ පවතින දුර්වලතා මගහරවා ගනිමින් වඩාත් ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වාදීමේ අරමුණින් සෙලාටා ටෙක් (පුද්ගලික) සමාගම විසින් ඇග්‍රෝ -බිස් නමින් පරිගණකගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. එම ව්‍යාපෘති යෝජනාව සඳහා කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය මගින් රු. මිලියන 37.860 ක ගැලපුම් ප්‍රදානයක් ලබා දීමට 2020 දෙසැම්බර් 30 දින	සෙලාටා ටෙක් (පුද්ගලික) සමාගම සඳහා උපරිම ගැලපුම් ප්‍රදාන රු.මිලියන 37.86 ක් අනුමත කරන ලදී. සුහුරු කෘෂිකාර්මික ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීම සඳහා 2020 දෙසැම්බර් 30 වැනි දින ගැලපුම් ප්‍රදාන ගිවිසුම අත්සන් කරන ලද අතර තම දායකත්වයෙන් අවශ්‍ය ඉතිරි මුදල සපයාගැනීම සත්‍යාපනය කිරීමෙන් පසු අනුමත ගැලපුම් ප්‍රදානවල 01 වන ගැලපුම් ප්‍රදානය ලෙස රු. 18,825,450 ක් නිදහස් කරන ලදී. 2022 ජූනි 29 වැනි දින ලඟා කරගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය	අරමුදල් විනිවිදභාවයෙන් භාවිතා කළ යුතුය.

	සෙලාටා ටෙක් (පුද්ගලික) සමාගම සමඟ ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. ව්‍යාපෘතිය විසින් තාක්ෂණික උපකරණ භෞතිකව පරීක්ෂා කිරීමකින් තොරව සෙලාටා ටෙක් (පුද්ගලික) සමාගම විසින් ප්‍රදානය භාවිතා කර මිල දී ගෙන ඇතැයි ලෙස ඉදිරිපත් කරන ලද ඉන්වොයිසි සඳහා පළමු සහ දෙවන ප්‍රදාන වශයෙන් රු. මිලියන 34.074ක් ගෙවා තිබුණි.	සත්‍යාපනය කිරීමෙන් පසු අනුමත ප්‍රදානයේ සංශෝධිත 2වන වාරිකය ලෙස රු.11,241,800ක් නිදහස් කරන ලදී. එබැවින් ලබා දී ඇති මුළු ප්‍රදාන මුදල රු. 30,067,250 කි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සෑහීමකට පත් නොවන බැවින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කර ඇති අතර සමාගම සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා තවදුරටත් ප්‍රමාදයකින් තොරව කටයුතු අවසන් කරන ලෙස ඔවුන්ට දැනුම් දී ඇත.	
(ඇ)	සෙලාටා ටෙක් (පුද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව සහ කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ එකඟ වූ ව්‍යාපෘති ඉලක්ක අනුව, වසර පහක කාලයක් සඳහා ඇග්‍රෝ -බිස් ව්‍යාපෘතිය මඟින් එක් එක් වර්ෂය තුළ සපුරා ගත යුතු ඉලක්ක වෙන වෙනම සඳහන් කර තිබුණි. 2023 දෙසැම්බර් වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර තුනක් ගත වී තිබුණද පළමු වසර අවසානයේදී ළඟා කර ගත යුතු ප්‍රකාශිත ඉලක්ක වෙත ළඟා වීමට අපොහොසත් වී තිබුණි.	සමාගම අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වූ බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තහවුරු කර ඇති අතර ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක වෙත යොමු කර ඇත. ලැබුණු සියලුම ප්‍රදාන අරමුදල් අදාළ පොලී ද සමඟ ආපසු ගෙවන ලෙස ලියාපදිංචි තැපෑලෙන් සමාගම් අධ්‍යක්ෂවරුන් වෙත අවසන් දැන්වීම යවා ඇත.(ආපසු ගෙවිය යුතු මුළු මුදල රු. 43,861,252 ලැබුණු ප්‍රදාන අරමුදල් ආපසු ගෙවීමට සමාගම අපොහොසත් වුවහොත්, ලබා දුන් ප්‍රදාන අරමුදල් ආපසු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබේ.	සැලසුම් කළ කාල රාමුව තුළ ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කළ යුතුය.

3.6 පෙර විගණන වාර්තාවල දක්වා ඇති මෙතෙක් නොවිසඳුණු ගැටලු

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2019/021/1/02-04 යටතේ එෆ්පීජී/සීඕ/2020/2/24 දරන පොකුරු ව්‍යාපෘතිය මඟින් පාලන්ත්‍රියාගොඩ එකමුතු කජ්රුක සමිතියේ සාමාජිකයින් 50 දෙනෙකු සඳහා රු.700,000ක් වටිනා ලණු ඇඹරුම් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන ඇතත්, 2020 නොවැම්බර් 25 වන දින රු. 120,000 බැගින් අනුමත කරන ලද කණ්ඩායම් ඉක්මවා පුද්ගලයන් 202 දෙනෙකුට රු.2,424,000 ක මුදලක් බැරකර තිබුණි. ලණු නිෂ්පාදන ආශ්‍රිතව නිර්මාණය කරන ලද ව්‍යවසායකයින්ගේ පොකුරු ව්‍යාපෘතියේ ප්‍රගතිය දකුණු පළාත්	එෆ්පීජී/සීඕ/2020/2/24 පොකුරු ව්‍යාපෘතිය පුද්ගලයන් 202ක් සඳහා රු.2,828,000ක් සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. වැවිලි අමාත්‍යාංශය යටතේ, " පාලන්ත්‍රියගොඩ එකමුතු කජ්රුක සමිතිය" ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීමේ වගකීම "කජ්රුක අරමුදල් කළමනාකරණ මණ්ඩලය" වෙත පවරා ඇත. තවද, ඔවුන් වෙනත් දත්ත සහ තොරතුරු පවත්වාගන්නා අතර, රජයට අනුබද්ධ ආයතනයක් නිසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඉහත මණ්ඩලය විශ්වාස කළ බව දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ ඉල්ලීම පරිදි මුදල් ලබා ගැනීමට හැකි විය. කෙසේ වෙතත්, දකුණු පළාතේ ආර්එම්ජීඑම් පද්ධතිය 2021 මාර්තු මාසයේදී ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාට පවසා ඇත්තේ සම්බන්ධීකරණ නිලධාරියා මාරු කර	අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ වැඩ කටයුතු කළ යුතුය.

ගැලපුම් ප්‍රදාන කළමනාකරු විසින් පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි.

ඇති බවත්, මෙයට අදාල වගකීම භාර ගන්නා මණ්ඩලයේ නිලධාරියා හඳුනාදෙන මෙන් ඔවුන් ඉල්ලා සිටින බවත්ය. එතැන් සිට මෙම ගැටළුව සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සම්බන්ධ කර නොමැති බව සටහන් කර ඇත.